# නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය

## නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය

## නාගරික සංවර්ධන, වෙරළ සංරක්ෂණ, අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය

තිරසර නාගරික ජනාවාස සංවර්ධනයක් ඇතිවන බවට සහතික වීම පිණිස දැනට පවතින නිවාස ඒකක වැඩි දියුණු කිරීම මඟින් හෝ වඩාත් යහපත් නිවාස පහසුකම් සහ අවම නාගරික පහසුකම් සඳහා ප්‍රවේශය සැලසීම මඟින් සේවා පහසුකම් අඩු නාගරික ජනාවාස වල වෙසෙන තැනැත්තන්ගේ ජීවන තත්ත්වය නඟා සිටුවීම නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ ප්‍රධාන අරමුණු වේ.

මෙම අරමුණු සාක්ෂාත් කර ගැනීමට මානව ජනාවාස සංවර්ධන ක්ෂේත්‍රයේ වෘත්තිකයින්ගේ දායකත්වය අවශ්‍ය බැවින් පහත සඳහන් පුරප්පාඩු තනතුරු සඳහා ස්ථිර පදනමින් බඳවාගැනීමට ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයඳුම්පත් කැඳවනු ලැබේ.

| තනතුර | වැටුප් කාණ්ඩය |
|---|---|
| සහකාර අධ්‍යක්‍ෂ (සමාජ සජීවිකරණ) | MM 1-1 |
| තාක්ෂණ නිලධාරි | JM 1-1 |
| සංවර්ධන නිලධාරි | MA 5-1 |
| දත්ත සැකසුම් සහකාර | MA 5-1 |
| ප්‍රජා සංවර්ධන සහකාර | MA 3 |
| තාක්‍ෂණික සහකාර | MA 2-1 |
| කළමණාකරණ සහකාර (තා. නො) | MA1-1 |
| සමාජ සංවර්ධන සහකාර | MA1-1 |
| කාර්යාල කාර්ය සහයක | PL 1 |
| ලේඛන භාරකරු | PL 1 |

### බඳවා ගැනීමේ පොදු සුදුසුකම්

සෑම අපේක්ෂකයෙකුම

අ. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

ආ. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්තවිය යුතුය.

ඇ. විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

### 01. සහකාර අධ්‍යක්ෂ (සමාජ සජීවීකරණ)

**අධ්‍යාපන සුදුසුකම්**

(අ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් සමාජ විද්‍යාව විෂයක් ලෙස ඇතුලත් ප්‍රථම උපාධිය

සමඟ

(ආ) උපාධිය ලබා ගැනීමෙන් පසු රජයේ හෝ රාජ්‍ය ආයතනයක හෝ රජය පිළිගත් පෞද්ගලික ආයතනයක සමාජ සජීවීකරණ කටයුතු පිළිබඳව හෝ ඒ හා සමාන ක්ෂේත්‍රයක අවම වශයෙන් වසර 03 ක සේවා පළපුරුද්දක් තිබීම

**වෙනත්**

ජාතික සමාජ සංවර්ධන ආයතනයේ (ශ්‍රී ලංකා සමාජ සේවා විද්‍යාලය) වෘත්තිය සමාජ වැඩ පිළිබඳ දෑ අවුරුදු පූර්ණ කාලීන ඩිප්ලෝමා ලබාතිබීම අතිරේක සුදුසුකමක් වශයෙන් සළකනු ලැබේ.

**වයස** අවු 25 ට නොඅඩු හා අවු 45 ට නොවැඩි විය යුතුය.

| | |
|---|---|
| වැටුප් පරිමාණය කළමණාකරණ සේවා චක්‍රලේඛ 02/2016 අනුව වේ. | රු. 53,175 - 10 x 1,375 - 15 x 1,910 - 95,575 |
| 2020.01.01 දිනට වැටුප් තලය | රු. 53,175.00 |
| දීමනා | ජීවන වියදම් දීමනා හා තනතුරට හිමි අනෙකුත් දීමනා |

**02. තාක්ෂණ නිලධාරි**

**අධ්‍යාපන සුදුසුකම්**

(අ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් සිවිල් ඉංජිනේරු/ ප්‍රමාණ සමීක්ෂණය/සැලසුම් ශිල්පය ඇතුළත්ව ලබාගත් විද්‍යාවේදී උපාධිය.

සමඟ

රජයේ හෝ රාජ්‍ය ආයතනයක හෝ රජය පිළිගත් පෞද්ගලික ආයතනයක තාක්ෂණ කටයුතු පිළිබඳව අවම වශයෙන් වසර 01 ක පළපුරුද්දක් තිබීම.

**වයස** අවු 25 ට නොඅඩු හා අවු 45 ට නොවැඩි විය යුතුය.

| | |
|---|---|
| වැටුප් පරිමාණය කළමණාකරණ සේවා චක්‍රලේඛ 02/2016 අනුව වේ. | රු. 42,600 - 10 x 755 - 18 x 1,135 - 70,580 |
| 2020.01.01 දිනට වැටුප් තලය | රු. 42,600.00 |
| දීමනා | ජීවන වියදම් දීමනා |

**03. සංවර්ධන නිලධාරි**

**අධ්‍යාපන සුදුසුකම්**

(අ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් සමාජ විද්‍යාව විෂයය හෝ කෘෂිකර්මය විෂයය ඇතුලත්ව ලබාගත් උපාධියක්

හෝ

(ආ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් උපාධිය සමඟ වෘත්තීය සමාජ වැඩ පිළිබඳ පූර්ණ කාලීන දෑ අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාව හෝ කෘෂිකර්මය පිළිබඳව ලබාගත් ඩිප්ලෝමා සහතිකය.

**වයස** අවු 22 ට නොඅඩු හා අවු 35 ට නොවැඩි විය යුතුය.

| | |
|---|---|
| වැටුප් පරිමාණය කළමණාකරණ සේවා චක්‍රලේඛ 02/2016 අනුව වේ. | රු. 34,870 - 10 x 660 - 15 x 755 - 11 x 930 - 63,025 |
| 2020.01.01 දිනට වැටුප් තලය | රු. 34,870.00 |
| දීමනා | ජීවන වියදම් දීමනා |

## 04. දත්ත සැකසුම් සහකාර

**අධ්‍යාපන සුදුසුකම්**

(අ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් පරිගණක විද්‍යාව, සංඛ්‍යානය/ තොරතුරු තාක්ෂණය/ පරිගණනය හා කළමනාකරණය සහ නගර සහ ග්‍රාම නිර්මාණ විෂයය ඇතුලත්ව ලබාගත් උපාධිය

**වයස** අවු 22 ට නොඅඩු හා අවු 35 ට නොවැඩි විය යුතුය.

| | |
|---|---|
| වැටුප් පරිමාණය කළමණාකරණ සේවා චක්‍රලේඛ 02/2016 අනුව වේ. | රු. 34,870 - 10 x 660 - 15 x 755 - 11 x 930 - 63,025 |
| 2020.01.01 දිනට වැටුප් තලය | රු. 34,870.00 |
| දීමනා | ජීවන වියදම් දීමනා |

## 05. ප්‍රජා සංවර්ධන සහකාර

**අධ්‍යාපන සුදුසුකම්**

(අ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ඕනෑම විෂය ක්ෂේත්‍රයකින් ලබාගත් උපාධියක්

**වෙනත් සුදුසුකම්**

වෘත්තිය සමාජ වැඩ පිළිබද පූර්ණ කාලීන දෑ අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාව හෝ රජය පිළිගත් ආයතනයකින් කෘෂිකර්මය පිළිබද ඩිප්ලෝමා සහතිකය/ සමාජ විද්‍යා විෂය පිළිබද ඩිප්ලෝමා සහතිකය ලබාතිබීම

**වයස** අවු 22 ට නොඅඩු හා අවු 35 ට නොවැඩි අය වියයුතු

| | |
|---|---|
| වැටුප් පරිමාණය කළමණාකරණ සේවා චක්‍රලේඛ 02/2016 අනුව වේ. | රු.32,200 - 10 x 445 - 11 x 660 -10 x 730 -5 x 750- 54,960 |
| 2020.01.01 දිනට වැටුප් තලය | රු. 32,200.00 |
| දීමනා | ජීවන වියදම් දීමනා |

## 06. තාක්ෂණ සහකාර

**අධ්‍යාපන සුදුසුකම්**

(අ) භාෂාව හෝ සාහිත්‍ය,ගණිතය සහ විද්‍යාව ඇතුළුව විෂයන් 06 කින් අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගය සමත්වීම.

සහ

**වෘත්තිය කුසලතා**

(අ) තෘතිය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නියම කර ඇති පරිදි ජාතික වෘත්තිය කුසලතා (NVQ) 05 වන මට්ටමට නොඅඩු මට්ටමක තිබෙන,

1, තාක්ෂණික විද්‍යා ජාතික ඩිප්ලෝමා සහතිකය (සිවිල් ඉංජිනේරු)

හෝ

11, උසස් ජාතික ඩිප්ලෝමාව (ඉංජිනේරු) සහතිකය ලබා තිබීම

හෝ

111, ජාතික තාක්ෂණික සහතිකය (ඉංජිනේරු/ප්‍රමාණ සමීක්ෂණ) හෝ ඒ හා සමාන රජයේ පිළිගත් තාක්ෂණික ආයතනයක සිවිල් ඉංජිනේරු සහතිකය/ප්‍රමාණ සමීක්ෂණ සහතිකය ලබා තිබීම

**වයස** අවු 18 ට නොඅඩු හා අවු 35 ට නොවැඩි අය විය යුතුය.

| | |
|---|---|
| වැටුප් පරිමාණය කළමණාකරණ සේවා චක්‍රලේඛ 02/2016 අනුව වේ. | රු.30,310 - 10 x 300 - 7 x 350 -4 x 495 -20 x 660-50,940 |
| 2020.01.01 දිනට වැටුප් තලය | රු. 30,310.00 |
| දීමනා | ජීවන වියදම් දීමනා |

## 07. කළමනාකරණ සහකාර (තා. නො)

**අධ්‍යාපන සුදුසුකම්**

(අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී සිංහල/ දෙමළ භාෂාව,ගණිතය සහ ඉංග්‍රිසි භාෂාව ඇතුළුව තවත් විෂයයන් එකකට සම්මාන සමාර්ථයන් සමඟ විෂයයන් හයක් (06) සමත්ව තිබීම.

සහ

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය විෂයයන් තුනක් (03)(සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.

වෙනත්
පහත සඳහන් කවර හෝ සහතිකයක් ලබා තිබීම අමතර සුදුසුකම් වශයෙන් සලකනු ලැබේ.
(අ) AAT අන්තර් මධ්‍ය විභාගය සමත්වීම.
(ආ) වරලත් ගණකාධිකරණ ආයතනය විසින් නිකුත් කරනු ලබන පදනම් මට්ටම පිළිබඳ සහතිකය ලබා තිබීම.
(ඇ) වරලත් ගණකාධිකරණ හා කළමනාකරණ ආයතනය විසින් නිකුත් කරනු ලබන පදනම් මට්ටම පිළිබඳ සහතිකය ලබා තිබීම.
(ඈ) රජයේ හෝ රජය පිළිගත් ආයතනයකින් ලබාගත් පරිගණක ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම.
(ඉ) රජයේ හෝ රජය පිළිගත් ආයතනයකින් ලබාගත් ලේකම් පරිචය පිළිබඳ සහතිකය ලබා තිබීම.

**වයස** අවු 18 ට නොඅඩු හා අවු 30 ට නොවැඩි අය විය යුතුය.

| | |
|---|---|
| වැටුප් පරිමාණය කළමණාකරණ සේවා චක්‍රලේඛ 02/2016 අනුව වේ. | රු. 27,910 10x300-7x350-4x495-20x660 -48,540 |
| 2020.01.01 දිනට වැටුප් තලය | රු. 27,910.00 |
| දීමනා | ජීවන වියදම් දීමනා |

## 08. සමාජ සංවර්ධන සහකාර

**අධ්‍යාපන සුදුසුකම්**

(අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා. පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී සිංහල/ දෙමළ භාෂාව,ගණිතය සහ ඉංග්‍රිසි භාෂාව ඇතුළුව විෂයයන් හතරකට(04) සම්මාන සාමාර්ථය සමඟ එකවර විෂයන් 06 කින් සමත්ව තිබීම.

සහ

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී පැරණි විෂය නිර්දේශය අනුව විෂයන් (04) හෝ නව විෂය නිර්දේශය අනුව විෂයයන් තුනක් (03)(සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) එකවර සමත්ව තිබීම.

සහ

(ඇ) ජාතික සමාජ සංවර්ධන ආයතනය මගින් පිරිනමනු ලබන වෘත්තිය සමාජ වැඩ පිළිබඳ පූර්ණ කාලීන දෑ අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාව සමත් වීම.

**වයස** අවු 18 ට නොඅඩු හා අවු 30 ට නොවැඩි අය විය යුතුය.

| | |
|---|---|
| වැටුප් පරිමාණය කළමණාකරණ සේවා චක්‍රලේඛ 02/2016 අනුව වේ. | රු. 27,910 10x300-7x350-4x495-20x660 -48,540 |
| 2020.01.01 දිනට වැටුප් තලය | රු. 27,910.00 |
| දීමනා | ජීවන වියදම් දීමනා |

**09. කාර්යාල කාර්ය සහයක**

**10. ලේඛන භාරකරු**

**අධ්‍යාපන සුදුසුකම්**

(අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී යටත් පිරිසෙයින් විෂයයන් දෙකක් වත් සමත් වී තිබිය යුතුය.

**වයස** අවු 18 ට නොඅඩු හා අවු 45 ට නොවැඩි අය විය යුතුය.

(මෙම තනතුරු සඳහා 2020/01/08 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ මගින් ස්ථාපිත බහුකාර්ය සංවර්ධන කාර්ය සාධන බලකාය සඳහා තෝරීපත් වු අයට අයදුම් කල හැක)

| | |
|---|---|
| වැටුප් පරිමාණය කළමණාකරණ සේවා චක්‍රලේඛ 02/2016 අනුව වේ. | රු. 24,750 10x250-10x270-7x300-15x330 -37,000 |
| 2020.01.01 දිනට වැටුප් තලය | රු. 24,750.00 |
| දීමනා | ජීවන වියදම් දීමනා |

සුදුස්සන් තෝරාගැනීම සම්බන්ධයෙන් අවසන් තීරණය නාගරික ජනාවාස සංවර්ධන අධිකාරය සතු වේ. දැනට රාජ්‍ය සංස්ථා ව්‍යවස්ථාපිත මණ්ඩල සහ දෙපාර්තමේන්තුවල සේවය කරන අයට වයස් සීමාව බලනොපාන අතර ඔවුන් ආයතන ප්‍රධානීන් මගින් අයදුම්පත් යොමු කල යුතුය.

සියළුම ජීව දත්ත තොරතුරු ඇතුලත් අයඳුම්පත් සකස් කර අදාල සහතික පිටපත් ද සමග ඥාති නොවන දෙදෙනෙකුගේ නම, ලිපිනය, දුරකථන අංක සහිතව පහත ලිපිනයට 2020.10.16 දින හෝ ඊට ප්‍රථම අයඳුම් කරන තනතුර ද ලිපිකවරයේ වම්පස ඉහළ කෙලවරේ සටහන් කර ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

**අධ්‍යක්ෂ ජනරාල්**

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය
09 වන මහල
සෙත්සිරිපාය බත්තරමුල්ල
දුරකථන 011-2887721 ෆැක්ස් 011-2871305
ඊමේල් - dg.usda16@gmail.com